# පල්හොරුකන්ද ප්‍රාග් ඓතිහාසික ස්ථානය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය පිළිබඳ අධ්‍යයනයක්


## හරේන්ද්‍රලාල් නාමල්ගමුව[1], වත්සලා කරුණාරත්න අජන්තා[2], නිශලයා දර්ශනී අතපත්තු[3] සහ චම්පිකා කරුණාරත්න[4]


පල්හොරුකන්ද ප්‍රාග් ඓතිහාසික ස්ථානය හා ආශ්‍රිත ප්‍රදේශය සුවිශේෂී වැදගත්කමක් සහිත ප්‍රදෙශයක් ලෙස හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ සිංහරාජ වනාන්තරයේ බටහිර බෑවුමට වන්නට, වත්මන් ලබුගම හා කලටුවාව ජලාශවලට ආසන්නව පිහිටා ඇති පල්හොරුකන්ද ප්‍රාග් ඓතිහාසික යුගයට සම්බන්ධ සාදක විශාල ප්‍රමාණයක් අන්තර්ගතව ඇති ප්‍රදේශයකි. පල්හොරුකන්ද ගුහාව හා ඒ ආශ්‍රිත ප්‍රදේශය පිළිබඳව ප්‍රථම වරට පර්යේෂණ පවත්වන ලද්දේ පී.ඊ.පී.දැරණියගල විසිනි (Deraniyagala,1964). ඔහු විසින් කරන ලද මතුපිට ගවේෂණ මඟින් පල්හොරුකන්ද ලෙන ආශ්‍රිත වක්ඔය හා තුන්මෝදර ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගනු ලැබිණි. තුන්මෝදර එළිමහන් භූමි ප්‍රදේශයේ වාසය කළ බලංගොඩ මානවයා අධික වර්ෂා සහිත කාලවලදී මෙම ලෙන තම වාසස්ථානය කරගන්නට ඇති බවත්, වක් ඔය නම්නය බලංගොඩ මානවයා වාසය කළ විශාල කොළණියක් වූ බවත් දැරණියගල පෙන්වා දෙයි.

වර්තමානය වන විට යම් යම් අවස්ථාවල සිදු වූ මානව ක්‍රියාකාරකම් මත මෙම ගුහා ස්ථානයේ සංස්කෘතික පස් තැන්පතුව අතිශය ව්‍යාකූල තත්ත්වයකට පත්ව ඇත. මෙම පස් තට්ටු තුළ ශිලා මෙවලම්, සත්ත්ව අස්ථි, ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත්බවට සාධක සහිත *Acavus* ගොළුබෙලි ශේෂ බහුලව හමුවන අතර සාමුද්‍රික බෙල්ලන්ගේ අවශේෂ හමු වීම විශේෂ සිද්ධියකි.

මෙම පත්‍රිකාවේ අරමුණ වන්නේ පූර්ව පර්යේෂණවලදී අනාවරණය නොවූ යම් යම් සාධක අනාවරණය කිරීමත්, එම සධක

---


[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
ඊමේල්: namalwk@yahoo.com

[2] අජන්තා, ඥානවිමලාරාම මාවත, ඇහැලියගොඩ.

[3] 13 ඒ, ගෝණගහ, මාකෙවිට, ජාඇල.

[4] 245, පන්සල පාර, ගනේමුල්ල.

සියල්ල මගින් අතීත මානව සමාජය හා පුරාණ පාරසරික තත්ත්වය පිළිබඳව යම් නිගමනයකට එළඹීමටය.

**පාරිභාෂිත වචනඃ**

**Keywords:**